**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**ප්‍රාථමික අංශය**

**සැකසුම - R.D පුෂ්පකාන්ති**

**ගුරු උපදේශිකා**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

5 ශ්‍රේණිය - විෂය සමගාමී ක්‍රියාකාරකම්

ගණිතය

හැඩ හා ඝන වස්තු

❖ ආදරණීය දුවේ පුතේ මේ දිනවල ඔබේ නිවසේ එකතු වන දවටන හැකිතරම් එක්රැස් කර ගන්න (ආහාර දවටන හා අනෙකුත් දවටන )

❖ ඔබට පහසුවෙන්ම නිවසින් පහත සඳහන් දෑ සොයා ගත හැකිය

- කිරිපිටි පැකට්
- සබන් පෙට්ටි
- හිස් ගිනිපෙට්ටි
- සිද්ධාලේප පෙට්ටි
- බෙහෙත් පෙට්ටි
- සැමන් ටින්
- චීස් පෙට්ටි
- මාමයිට් පෙට්ටි
- බිස්කට් පෙට්ටි



























- ❖ පළමුව ගණක හා සනකාභ හැඩයේ පෙට්ටි අතින් ස්පර්ශ කර ඒවායේ විවිධ ලක්ෂණ හඳුනාගන්න.( සිද්ධාලේප පෙට්ටි / මාමයිට් පෙට්ටි / බිස්කට් පෙට්ටි)

- ❖ මුහුනත දාර හා ශීර්ෂ පිළිබඳ ඒවා ස්පර්ශ කරමින් සොයා බලන්න

- ❖ සිලින්ඩර හැඩයේ බිස්කට් ටින්, සැමන් ටින් , ආදිය පිළිබඳවත් ස්පර්ශ කරමින් මුහුණත් හා දාර පිළිබඳ සොයා බලන්න

- ❖ දැන් ඔබ ළඟ ඇති විවිධ හැඩයේ පෙට්ටි ප්‍රවේශමෙන් දිගහරින්න.





- ❖ එම හැඩයන් පිළිබඳව තොරතුරු සොයා බලමින් ඔබත් එවැනි විවිධ හැඩයේ පෙට්ටි කීපයක් නිර්මාණය කරන්න.

- ❖ චීස් පෙට්ටියක් දිගහැර ඒ පිළිබඳ සොයා බලන්න හැකි නම් එවැනි හැඩයෙන් නිර්මාණයක් කරන්න

